# ද්‍රවිඩ ජනයා අකමැති ව්‍යවස්ථාවක් ගේන්න දෙන්නේ නෑ



**විපක්ෂ නායක ආර්. සම්බන්ධන්**

1 වැනි පිටුවෙන්

# ද්‍රවිඩ ජනයා අකමැති ව්‍යවස්ථාවක් ගේන්න දෙන්නේ නෑ

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රටට අවශ්‍ය බවත් දැනට ස්ථාපිත කර තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය මගින් සම්පාදනය කරන නව ව්‍යවස්ථාවේ කෙටුම්පත ද්‍රවිඩ ජාතික සංවිධානය වෙත ඉදිරිපත් කරනු ඇති බවත් සම්බන්ධන් මහතා මෙම අවස්ථාවේදී ප්‍රකාශ කර තිබේ.

ද්‍රවිඩ ජාතික සංවිධානය වෙත නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ඉදිරිපත් කළ පසු එහි ඇති සියලු වගන්ති ද්‍රවිඩ ජනතාව වෙත හෙළිදරව් කරන බවද හෙතෙම ප්‍රකාශ කර ඇත. මෙසේ සකසන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්තින් ද්‍රවිඩ ජනතාවට හිතකර විය යුතු බවද යම් හෙයකින් දමිළ ප්‍රජාවට අහිතකර යෝජනා මෙහි ව්‍යවස්ථා කෙටුම්පතේ ඇත්නම් ද්‍රවිඩ ජාතික සන්ධානයේ සහාය ඊට නොලැබෙන බවද විපක්ෂ නායකවරයා ප්‍රකාශ කර තිබේ.

නව ව්‍යවස්ථාවට දමිළ ජනතාව කැමැතිනම් පමණක් තම සහායද ඊට ලැබෙනු ඇතැයි ද මෙම රැස්වීමේදී ප්‍රකාශ කර ඇති සම්බන්ධන් මහතා දමිළ ජනතාව අකමැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රටට ගෙන ඒම සඳහා පාර්ලිමේන්තුවේදී ද්‍රවිඩ ජාතික සන්ධානයේ ඡන්දය ලබානොදෙන බවද ප්‍රකාශ කර තිබේ.